# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2318/14 - 2023 පෙබරවාරි මස 07 වැනි අඟහරුවාදා - 2023.02.07

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### 2010 අංක 14 දරන සිවිල් ගුවන් සේවා පනත

2010 අංක 14 දරන සිවිල් ගුවන් සේවා පනතේ 117(2) උපවගන්තිය යටතේ වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යවරයා විසින් සාදනු ලබන නියෝග.

**නිමල් සිරිපාල ද සිල්වා,**
වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍ය.

2023 පෙබරවාරි මස 01 වැනි දින
කොළඹ දී ය.

**නියෝග**

අවසන් වරට 2022 නොවැම්බර් 02 දිනැති අංක 2304/46 දරන *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* සහ 2022 දෙසැම්බර් 09 දිනැති අංක 2309/34 දරන *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නියෝග වලින් සංශෝධිත, 2022 ඔක්තෝබර් 26 දිනැති අංක 2303/18 දරන *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද 2022 සිවිල් ගුවන් සේවා (ගගන යාත්‍රාංගන පරිහරණය කිරීම වෙනුවෙන් අය කරනු ලබන ගාස්තු) නියෝග, 2023 මාර්තු 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි පහත සඳහන් පරිද්දෙන් සංශෝධනය කරනු ලැබේ.

(1) එහි 2(1) වන නියෝගයෙහි "මඩකලපුව ජාත්‍යන්තර ගුවන් තොටුපල (ම.ජා.ගු)" යන වචන ඇතුළත් කිරීම මගින්

(2) එහි 2 වන නියෝගයෙහි -

(අ) එහි 2(4) උපනියෝගයට ඉනික්බිතිවම පහත දැක්වෙන අලුත් උපනියෝගය ඇතුළත් කිරීමෙන් :-
"2(5) මෙම නියෝග වල 2(1) (අ) ඡේදයෙහි සඳහන් කර ඇති ගොඩබෑසීම් හා නැවතුම් ගාස්තු වලට පටහැනිව කුමක් සඳහන් වුවද බ. ජා. ගු., ම.රා.ජා.ගු, කො.ජා.ගු.ර, යා.ජා.ගු. සහ ම.ජා.ගු. වෙත පැමිණෙන පුහුණු ගුවන් යානා වලට අදාළ අවම ගොඩබෑසීම් ගාස්තුව රුපියල් 1,000 ක් වන්නේය."

EOG 02-0014

1A - PG 6199 — 356 (2023/02) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*